**Trial Monitoring report (නඩු විභාග අධීක්ෂණ වාර්තාව)**

**About the case (කුමන නඩුවක් සම්බන්ධයෙන් ද):** වනාතවිල්ලුව ලැක්ටෝවත්තෙහි පුපුරණ ද්‍රව්‍ය සොයාගැනීම හා සබැඳි නඩුව

**Case no (නඩු අංකය):** PUTTLAM /TAB 107/2021

**Courts (අධිකරණය):** පුත්තලම මහාධිකරණය

**Date of hearing (නඩුව අසන ලද දිනය):** 2022 නොවැම්බර් මස 15 වන දින

**Author (s) of report (වාතර්ාවේ කතෘ හෝ කතෘන්):** නීතිඥ මනුෂිකා කුරේ.

## 1. Who was in courts:

| **Who** | **Names / other information** | **Comments** |
|---|---|---|
| **Judge (s) (විනිසුරු හෝ විනිසුරුවරුන්)** | විනිසුරු නිශාන්ත හපුආරච්චි මහතා,<br>විනිසුරු හසිත සමන් පොන්නම්පෙරුම මහතා සහ නයෝමි වික්‍රමසේකර විනිසුරුතුමිය | |
| **Attorney General's Dept. (නීතිපති දෙපාතර්මේන්තුව)** | රජයේ අධිනීතිඥ සජිත් බණ්ඩාර<br>නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් වසන්ත පෙරේරා | |
| **Police (CID / TID etc.) (පොලීසිය - අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව/ත්‍රස්ත විමශර්න ඒකකය/ වෙනත්)** | - | |
| **Accused / Suspects (චූදිත/ සැකකරුවන්)** | 1. අබු හනීෆා මොහොමඩ් මුෆිස් හෙවත් මුෆිස් හෙවත් අබු දහිදා<br>2. අමීර් හම්සා මොහොමඩ් හමාස් හෙවත් හමාස් හෙවත් අබු සාෆියා<br>3. මොහොමඩ් සරීෆු ආදම් ලෙබ්බේ හෙවත් ගෆූර් මාමා හෙවත් ගෆූර් නානා හෙවත් අබු හදීද්<br>4. මොහොමඩ් ඊබ්‍රහිම් සාදික් අබ්දුල්ලා හෙවත් සාදික් හෙවත් සාදික් අබ්දුල්ලා හෙවත් අබු උමර්<br>5. මොහොම්මදු ඊබ්රහිම් මොහොම්මදු නවුෆර් හෙවත් නවුෆර් මවුලවි හෙවත් අබු සෙයිද්<br>6. මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිද් හෙවත් සාජිද් මවුලවි හෙවත් අබු නජා | |
| **Lawyers for accused / suspects (චූදිතයන් / සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | 1 වන චූදිත වෙනුවෙන් නීතිඥ මොහොමඩ් සජ්ජාත් මහතා සමඟින් නීතිඥ රුෂ්ඩි හබීබ් මහතා පෙනී සිටින ලදී.<br><br>2 වන චූදිත වෙනුවෙන් නීතිඥ රුෂ්ඩි හබීබ් මහතා පෙනී සිටින ලදී.<br><br>3 වන චූදිත වෙනුවෙන් රජයෙන් පත් කළ නීතිඥ ඒ.එච්.එම් අල්තාෆ් මහතා පෙනී සිටින ලදී. | |

| | | |
|---|---|---|
| | 4 වන චූදිත වෙනුවෙන් නීතිඥ රුෂ්ඩි හබීබ් මහතා පෙනී සිටින ලදී.<br><br>5 වන චූදිත වෙනුවෙන් රජයෙන් පත් කළ නීතිඥ අද්නාන් ෆසාල් මහතා පෙනී සිටින ලදී.<br><br>6 වන චූදිත වෙනුවෙන් නීතිඥ කුසල වරාපිටිය මහතා සමඟ ගසාලි හුසේන් මහතා පෙනී සිටින ලදී. | |
| **Aggrieved party (අගතියට පත් පාශර්වය)** | - | |
| **Lawyers for aggrieved party (අගතියට පත් පාශර්වය වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | - | |
| **Supporters of accused / suspects (චූදිතයන්ගේ / සැකකරුවන්ගේ ආධාරකරුවන්)** | - | |
| **Supporters of aggrieved party (අගතියට පත් පාශර්වයේ ආධාරකරුවන්)** | - | |
| **Others (වෙනත් අය)** | මාධ්‍යවේදීන්, බන්ධනාගාර විශේෂ කාර්ය බලකාය (මහාධිකරණ ශාලාවෙන් පිටත සිටියේය.), බන්ධනාගාර නිලධාරීන්, පොලිස් නිලධාරීන් | |

## 2. What happened in the court hearing (උසාවි විභාගයේදී සිදු වූ දේ)?

පැමිණිල්ලේ සාක්ෂි අංක 12 සහ 13 කැඳවා ඇති බවටත්, පැමිණිල්ලේ සාක්ෂි අංක 13 වෙනුවෙන් සිතාසි ගියවර ඉල්ලා නොසිටියත් ඔහු මෙදින අධිකරණයට පැමිණ සිටින බවටත් පැමිණිලි පාර්ශවය වෙනුවෙන් පෙනී සිටින ලද රජයේ නීතිඥවරුන් අධිකරණයට දන්වා සිටින ලදී.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1 සඳහා ගියවර සිතාසි නිකුත් කරන ලෙස ඉල්ලා සිටි බවත්, පැමිණිල්ලේ සාක්ෂි අංක 1 ට විරුද්ධව නුවරඑළියේ මහාධිකරණයේ අධිචෝදනා ගොණු කර ඇති බව නීතිඥ රුෂ්ඩි හබීබ් මහතා දැන්වූ බවත් දක්වමින් මෙදින ඔහුව බන්ධනාගාරයෙන් ගෙන්වා ඇති නමුත් ඔහුව සාක්ෂියට කැඳවීමේ නෛතික බාධා ඇති බවක් පෙනීයාම හේතුවෙන් තාවකාලිකව මුදාහරින ලෙස පැමිණිලි පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතුන් අධිකරණයට දන්වා සිටින ලදී.

පෙර නඩු දිනයකදී විත්තියේ නීතිඥවරුන් ඉල්ලා සිටින ලද පරිවර්තන ලේඛන (පැමිණිල්ලේ සාක්ෂි අංක 13 වූ විජේරත්නගේ ප්‍රකාශයේ පරිවර්තනය) පැමිණිල්ල මෙහෙයවන ලද රජයේ නීතිඥ මහතුන් විසින් විත්තිය වෙත ලබා දීමක් සිදු කරන ලදී.

පැමිණිල්ලේ සාක්ෂි අංක 12 වන, අවුරුදු 59ක් වයසැති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ (CID) සේවයේ නියුතුව විශ්‍රාම යන ලද විශ්‍රාමික පොලිස් පරීක්ෂක ඩයස් පද්මසිරි මහතා කැඳවා මූලික ප්‍රශ්න ඇසීම ආරම්භ

කරන ලදී. එහිදී සාක්ෂි ලබා දෙමින් තමන් අවි ආයුධ සහ පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් දැනුවත් වීම් පුහුණු වීම් ලබා ඇති බවට දක්වන ලදී. තමන් විසින් පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධව රාජකාරි කටයුතු වලට සහභාගී වී ඇති බවටත්, පුපුරණ ද්‍රව්‍ය භාරගැනීම සම්බන්ධ සහය දීම් සිදු කර ඇති බවටත් සාක්ෂි ලබා දෙන ලදී.

2018 වර්ෂයේ දෙසැම්බර් මස මාවනැල්ලේ බුදු පිළිම වලට හානි කිරීම සම්බන්ධව විමර්ශන වලට තමන් සහභාගී වූ බවට සාක්ෂි ලබා දෙන ලදී. මෙහි මුල් විමර්ශන කටයුතු වලට CID හී කණ්ඩායමක් ද සහභාගී වූ බවටත් එම කණ්ඩායමේ පොලිස් පරීක්ෂක මාරසිංහ මහතා, සාජන් විජේරත්න, PC ධම්මික, PC රත්නායක සහ සාක්ෂිකරු සිටි බවටත්, එකළ CID හී අධ්‍යක්ෂක ලෙස ශානි අබේසේකර මහතා සිටි බවටත් සාක්ෂි ලබා දෙන ලදී.

පැමිණිලි පාර්ශවය වෙනුවෙන් පෙනී සිටින ලද රජයේ නීතිඥ මහතුන් කරන ලද සාක්ෂි විමසීම් හමුවේ පිළිතුරු දෙමින් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියේ 2018.12.26 වන දින උදේ වරුවේ පිටත්ව කෑගල්ල පොලිස් අධිකාරී කාර්යාලයට සාක්ෂිකරුද සිටි කණ්ඩායම ගිය බවයි.

සාක්ෂිකරු වැඩිදුරටත් සාක්ෂි ලබා දීමේදී පහත කරුණු සාක්ෂි ලෙස අනාවරණය විය. ඒ වන විට මාවනැල්ල බුදු පිළිම කැඩීමට සැකකරුවන් අත්අඩංගුවට ගෙන සිටි බවටත්, තවත් සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට සොයමින් සිටි බවටත් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව අත්අඩංගුවට නොගත් සොයමින් සිටි සාක්ෂිකරුවන් දෙදෙනෙක් සිට ඇත. එනම්, සාදික් සහ සහිඩ් යන සහෝදරයන් දෙදෙනෙකි. ඔවුන් ගැන සොයා බැලීමේදී අනාවරණයව ඇති තොරතුරු වන්නේ, ඒ වන විට පොළොන්නරුවේ සැකකරුවකු වන පයාස් ව පොලිස් නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇති බවටත්, ඔහුට සහිඩ් යන සැකකරුවකු දුරකථන ඇමතුම් ලබා දී ඇති බවටත්ය. පයාස් යනු සාහිඩ් සහ සාදික්ගේ නැගණිය විවාහ වීමට සිටි පුද්ගලයාය. පයාස්ව හමු වී CIDය විසින් ප්‍රකාශ සටහන් කරගෙන ඇත. පසුව ඔහුව කෑගල්ල පොලිස් ස්ථානයට ගෙන්වා 2019.01.06 වන දින පළමුව ප්‍රශ්න කර ඇත. නැවත 2019.01.15 දින පයාස් නමැත්තාගෙන් නැවත ප්‍රශ්න කිරීමක් කර ඇත. පයාස් අත්අඩංගුවේ සිටි පුද්ගලයකු නොවේ. පයාස් නමැත්තාගේ ජංගම දුරකථන විස්තර ලබාගෙන තිබූ අතර එහිදී එක් දුරකථන අංකයක් පිළිබඳව විශේෂ අවධානයක් යොමු වී ඇත. පුත්තලම ප්‍රදේශයෙන් දුරකථන ඇමතුමක් ලැබී ඇති බව නිරීක්ෂණය කර ඇත. එහි කෙටි පණිවිඩ පිළිබඳවත් සොයා බලා ඇත. එම කෙටි පණිවිඩයේ තිබී ඇත්තේ, I am Shaheed, Puttalam යනුවෙනි. ඒ අනුව එම දුරකථන අංකය ගැන විමශර්න කටයුතු සිදු කර ඇත. ඒ අනුව ජංගම දුරකථන අංකය හිමි ග්‍රාහක මුෆීස් නැමැත්තාගේ පුත්තලම ප්‍රදේශයේ ලිපිනයක් සොයාගෙන ඇත. 2019.01.16 දින පාන්දර කෑගල්ලෙන් පිටත්ව උදෑසන 10ට පමණ පුත්තලම නගරයට පැමිණ පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගොස් ජංගම දුරකථන අංකයේ ග්‍රාහකයාගේ ලිපිනයට අදාළ වසමේ ග්‍රාමසේවක හමුවී තොරතුරු ලබාගෙන ඇත. කෑගල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් ද මෙහිදී CID සමඟ පුත්තලමට පැමිණ ඇත. එමෙන්ම තවත් ඔත්තුකරුවකු පුත්තලමේදී සම්බන්ධ වී ඇත. මුෆීස් එම ප්‍රදේශයේ පදිංචි නොමැති බවටත් ඔහු පුත්තලම මන්නාරම මාර්ගයේ අටේ කණුව හරියේ කුකුල් කොටුවක් කරගෙන යන බවටත් අනාවරණය වී ඇත. ඒ අනුව අටේ කණුව අසල විමර්ශන කටයුතු සිදු කර ඇත. ඒ අනුව ෆාම් කිහිපයකටම යමින් විමර්ශන කටයුතු කර ඇත. කතෝලික පල්ලිය අසලින් වමට යන පාරේ ෆාම් එකක ඔහු සිටින බවට තොරතුරු ලැබී ඇත.

අදාළ පොල්වත්ත වනාතවිල්ලුවේ ලැක්ටෝස් වත්ත වන බවටත්, එය පිහිටි එම ප්‍රදේශය ජනාකීර්ණ ප්‍රදේශයක් නොවන බවටත්, කජු වතු හා පොල්වතු දක්නට ලැබුණු බවටත්, දුෂ්කර මාර්ග තිබූ බවටත්, නිතරම වාහන

ගමන් ගන්නා ප්‍රදේශයක් නොවන බවටත්, කැලේ මෙන් එහි වැවී තිබූ බවටත්, එය හුදකලා ස්ථානයක පිහිටි බවටත් සක්ෂිකරුගේ සාක්ෂි හරහා ප්‍රකාශ විය. සාක්ෂිකරු යන ලද ජීප් රථය මග නතරකොට තමා ඇතුළු කණ්ඩායම ගිය බවටත් එහිදී වත්තට ඇතුළු වීමට ලී ගේට්ටුවක් තිබූ බවටත්, කම්බි වැටක් ගසා තිබූ බවටත්, එම කම්බි වැට අලුත් එකක් බවටත්, කම්බි කැලි කිහිපයක් ඉතිරිව තිබූ බවටත්, ලී ගේට්ටුව අගුළු දමා නොතිබූ බවටත්, ඒ අවස්ථාවේදී පාරේදී පුද්ගලයකු හමු නොවූ බවටත්, තමා ඇතුළු කණ්ඩායම ගේට්ටුවෙන් ඇතුලට ගිය බවටත්, ගේට්ටුවේ සිට යාර 200කට වැඩිය යාමට අවශ්‍ය බවත්, එවිට නිවසක් (මඩුවක්) දුටු බවටත්, එම නිවසේ වහලෙහි ඇස්බැස්ටස් තිබුණ බවටත්, එහි වහලේ සූර්ය කෝෂ සවිකර තිබූ බවටත්, එය විදුලි බලය තිබූ ප්‍රදේශයක් නොවන බවටත් සාක්ෂිකරුගේ සාක්ෂි හරහා අනාවරණය විය.

එහි මිදුලේ දෙදෙනෙකු සිටි බවටත්, නිවස ඉදිරිපිට ඔවුන් දෙදෙනා සිටි බවටත්, ඔවුන් දෙදෙනාගෙන් එක් අයකුගේ අතේ යකඩ ඉන්නක් තිබූ බවටත්, ඔවුන්ගේ කකුල් වල මඩ තිබූ බවටත්, එය වැහි කාලයක් නොවන බවටත් සාක්ෂිකරු පැමිණිලි පාශර්වය වෙනුවෙන් පෙනී සිටි රජයේ නීතිඥවරුන් කරන ලද සාක්ෂි විමසීම් හමුවේ පිළිතුරු දෙමින් ප්‍රකාශ කරන ලදී. එම පුද්ගලයන් දෙදෙනා මුෆීස් සහ හමාස් වන බවටත් ගල් ඉන්න අතේ තබාගෙන සිටි පුද්ගලයා මුෆීස් බවටත් ප්‍රකාශ කරන ලද සාක්ෂිකරු 1 සහ 2 විත්තිකරුවන් පිළිවෙලින් මුෆීස් හා හමාස් බවට අධිකරණයේදී හඳුනා ගන්නා ලදී. එම ස්ථානයට තවත් පුද්ගලයන් දෙදෙනෙකු පැමිණි බවටත්, ඔවුන්ව රඳවා ගත් බවටත්, ඔවුන් දෙදෙනා මුෆීස්ගේ ඥාතීන් දෙදෙනෙකු බවට දැනගන්නට ලැබුණු බවටත් සාක්ෂිකරු සාක්ෂි ලබා දෙන ලදී. පසුව පැමිණි එම පුද්ගලයන් දෙදෙනාවද අත් අඩංගුවට ගත් බවටත් පසුව විමශර්න සිදු කර ඔවුන් දෙදෙනාව මුදාහරින ලද බවටත් සාක්ෂිකරු සාක්ෂි ලබා දෙන ලදී.

රජයේ නීතිඥවරයා තවදුරටත් කරන ලද සාක්ෂි විමසීම් (මූලික ප්‍රශ්න) හමුවේ සාක්ෂිකරු විසින් ලබා දෙන ලද සාක්ෂි ඔස්සේ මුෆීස් නැමැත්තා පදිංචිව සිටි නිවසත් එම ලැක්ටෝස්වත්තෙහිම තිබූ බව සඳහන් විය.

නැවතත් ප්‍රශ්නගත නිවස (මඩුව) පිළිබඳව සාක්ෂි විමසීම් හමුවේ සාක්ෂි ලබා දෙමින් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියේ, අල්මාරියක් කාමරයේ තිබූ බවත්, සූර්ය පැනල හරහා වැල් ඇද එය බැටරියකට සම්බන්ධ කර රාත්‍රී කාලයේදී විදුලිය ලබා ගැනීමට මෙන් තිබූ බවටත්, කබඩ් එකක් තිබූ බවටත් එහි දොරවල් වසා තිබූවත් අගුලු දමා නොතිබූ බවටත්, PC රත්නායක මහතා පරික්ෂා කිරීමේදී එම අල්මාරිය තුල තිබී ඩෙටර්නේටර් සොයාගත් බවටත්ය.මිරිස් කුඩු, පරිප්පු, කිරි පැකට් වැනි ආහාර වර්ගද හමු වී ඇත.

ඇඳුම් ද හමු වූ බවට සාක්ෂිකරු සාක්ෂි ලබා දෙන ලදී. එහිදී, ඇඳුම් කාගේද යන්න ප්‍රශ්න කළ බවටත්, එහිදී පළවෙනි විත්තිකරු එම ඇඳුම් ඔහුගේ බවට පැවසූ බවටත්, එම ඇඳුම් දිගහැර මුෆීස්ට තියා බැලූ කල්හී එම කලිසම ඔහුගේ පපුව ළඟට පමණ උස වූ බවටත්, එය පළවෙනි විත්තිකරුගේ ඇඳුම් නොවන බවට හැඟී ගිය බවටත්, ඇඳුම් ලෙස කලිසම් සහ ටී ෂර්ට් තිබූ බවටත්, මෙම ස්ථානයේ කවුරුන් හෝ ලැඟුම් ගෙන සිටි බවටත් එම අවස්ථාවේදී සක්ෂිකරුට හැඟී ගිය බවටත් සාක්ෂිකරු සාක්ෂි ලබා දෙන ලදී.

ඩෙටර්නේටර් එහා පැත්තේ කලපුවේ මාළු මැරීමට ගෙනා බවට මුෆීස් පැවසූ බවට සාක්ෂිකරු පවසන ලදී.

එම ස්ථානයේ සැමන් ටින්, ගෑස් කුකර් එකක් තිබූ බවටත්,ස්තොප්පුවේ ලී කැලි වගයක් තිබූ බවටත් සාක්ෂිකරු සාක්ෂි දෙන ලදී.

කාමරයේ බීකර් වගයක් තිබූ බවටත්, එම බීකර සාමාන්‍යයෙන් විද්‍යාගාර වල තිබෙන්නේ යනුවෙන් ද සාක්ෂිකරු සාක්ෂි ලබා දෙන ලදී. කළු පාට කෑන් වගයක් තිබූ බවටත්, ඒ තුළ නයිට්‍රික් ඇසිඩ් තිබූ බවටත්,

කෑන් සියල්ල එක වගේ බවටත්, කෑන් පරිමාව 20Lක් 25L පමණ වන බවටත්, එයින් 6 ක සම්පූර්ණයෙන් නයිට්‍රික් ඇසිඩ් පිරී තිබූ බවටත්, ඒවා නයිට්‍රික් ඇසිඩ් බවට ගසා තිබූ බවටත් සාක්ෂිකරු පැවසීය. එමෙන්ම ඒවා තිබෙන්නේ කුකුලන්ගේ කකුල් වල තුවාල වලට දැමීමට බවට මුෆීස් පැවසූ බවට සාක්ෂිකරු පවසන ලදී. නමුත් පැහැදිලි උත්තරයක් ලැබී නැත.

නිවස ඉදිරිපිට වලවල් හාරා ඊට උඩින් තණකොළ වගයක් දමා තිබූ බවටත්, නිවසේ පිටුපස වලක් හාරා තිබූ බවටත්, වැඩිදුර විමර්ශන වලදී එම වලවල් වල දමා ඇත්තේ මොනාද යන්න පරීක්ෂා කළ බවටත්, තණකොළ තිබූ වලවල් ලී කෝට්ටකින් ඇනීමේදී ටොක් ටොක් සද්දයක් ඇසූ බවටත්, එය පොළවේ සද්දයක් නොවන බවටත් සාක්ෂි ලබා දෙන ලදී. එම වලවල් තුළ නිල්පාට බැරල් කළුපාට මූඩි වලින් වසා තිබූ අතර, සුදු පැහැති ඇට ඇට වැනි දෑ තිබූ බවටත්, ඒවා පිළිබඳ ප්‍රශ්න කිරීමේදී මෙම නිවසේ පිරිසක් නතරව සිට ඒවා තබා ගොස් ඇති බවට පැවසූ බවටත් සාක්ෂි ලබා දෙන ලදී.

මෙම ඉඩම මුෆීස්ගේ පියාට අයිති වූ ඉඩමක් බවටත්, පියා මියගිය පසු මුෆීස්ගේ මවට, මුෆීස්ට සහ නංගිලා හට බෙදී ගොස් තිබූ බවටත්, කුකුල් ෆාම් එක තිබූ ඉඩම් කොටස මුෆීස්ට අයිති බවට අනාවරණය වූ බවටත් සාක්ෂි ලබා දෙන ලදී.

තවදුරටත් සාක්ෂි ලබා දෙමින් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියේ, සවස 6, 6.30 පමණ වන තෙක් මෙම රාජකාරි වල නිරත වූ බවත්, මෙම ස්ථානයට පැමිණියේ පුපුරණ ද්‍රව්‍ය සොයාගෙන නොවන බවත්, මේ සොයාගැනීම් සම්බන්ධයෙන් ඒ අවස්ථාවේම සහකාර පොලිස් අධිකාරීට, අධ්‍යක්ෂවරයා වූ ශානි අබේසේකර මහතාට දැනුම් දුන් බවත්ය. දැනුම් දීමෙන් අනතුරුව STF අය පැමිණි බවටත්, හමාස් පුත්තලම ප්‍රදේශයේ පදිංචිකරුවකු බවට අනාවරණය කර ගත් බවටත්ය.

කුකුල් කොටුව තිබෙනවා යැයි පැවසූ ස්ථානයේ යූරියා 50මිටි 9ක්ද කොහෙද තිබූ බවටත්, යූරියා කල් තබා ගැනීමට බැහැ දියවන බවටත්, එම ස්ථානයේ තිබූ යූරියා හොඳ තත්වයේ තිබූ බවටත් සාක්ෂි ලබා දෙන ලදී.

රාත්‍රී කාලයේ එම ස්ථානයේ රැඳී සිටියත්, රාජකාරි කටයුතු වල යෙදී නොසිටිය බවටත්, ඉන් අනතුරුව එම ස්ථානයට CID අධ්‍යක්ෂකවරයා සහ වෙනත් නිලධාරීන් ද පැමිණි බවටත්, පසු දින උදෑසන නැවත වැඩ ආරම්භ කර සොයාගත් භාණ්ඩ එක් තැනකට රැස්කර ලේඛනගත කර බවටත්, රස පරීක්ෂක නිලධාරියකු පැමිණි බවටත් සාක්ෂි ලබා දෙන ලදී.

එම සියලු භාණ්ඩ මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණයට භාර දුන් බවට සාක්ෂිකරු ප්‍රකාශ කරන ලදී. 17 වෙනිදා CID එකට මුලින් එම භාණ්ඩ ගෙනා බවටත්, සැකකරුවන් සිවු දෙනාත් CID එකට ගෙනා බවටත්, මෙයට නඩු පැවරීම හා සබැඳිව මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ බවටත්, සාක්ෂිකරු මහේස්ත්‍රාත් අධිකරණයට බඩු භාරදීමට ගිය බවටත් සාක්ෂිකරු සාක්ෂි දෙන ලදී.

දැනටමත් සලකුණු කර ඇති පැ3,4,5 ලේඛන මෙම සාක්ෂිකරුට පෙන්වා සිටින ලදී.

පැ3 ලේඛනය මෙම නඩු භාණ්ඩ ඇතුලත් ලේඛනය වේ. එම නඩු භාණ්ඩ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ කාමරයට භාර දී ඇත (CID උපසේවයට භාර දී ඇති භාණ්ඩ මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණයට දී ඇත.). මෙම නඩු භාණ්ඩ මහේස්ත්‍රාත් අධිකරණයට භාර දී තිබෙන්නේ 2019.01.31 දින දී බවත්, මාවනැල්ල

මහේස්ත්‍රාත් අධිකරණයට සාක්ෂිකරු හා ධම්මික නැමති කොස්තාපල්වරයකු ගිය බවටත්, නඩු භාණ්ඩ මොවුන් දෙදෙනා භාර දී ඇති බවටත් සාක්ෂි ලබා දෙන ලදී.

පැ3,4 සහ 5 අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තිය යටතේ පිළිගැනීම් ලෙස ලකුණු කරන ලදී. පැමිණිල්ලේ සාක්ෂි අංක 12 වන උ.පො.කො ඩයස් පද්මසිරි යන නිලධාරියා විසින් මේ වන විටත් අධිකරණය පැ3,4 සහ 5 ලෙස ලකුණු කළ PR 8න්19, 9න්19, 10න්19 ලෙස නම් කර ඇති දේපළ කුවිතාන්සි ... පො.සැ 50/2012 ලලිත් යන නිලධාරියාගේ භාරයේ තිබියදී පැමිණිල්ලේ සාක්ෂි අංක 12 විසින් ලබාගෙන එම භාණ්ඩ නිසි ආකාරයෙන් මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ භාරකරු ලෙස කටයුතු කරන ලද P.A මාලිනී වෙත 2019.01.31 දින භාර දුන් බව. (භාරදුන්නා යන ක්‍රියාව පමණක් වූදිත පාර්ශවයෙන් පිළිගනී.)

1,2 සහ 4 වන වූදිතයන් වෙනුවෙන් කියා සිටියේ, රජයේ අධිනීතිඥවරයාගේ ඉහත ප්‍රකාශයට විරෝධතාවයක් නොදක්වන බවත්, කෙසේ නමුත් පැ3,4 සහ 5 භාණ්ඩ උපසේවයෙන් නඩු භාර නිලධාරිනී මාලිනී මහත්මියට භාරදුන් බවයි. (කෙසේ නමුත් Admisson තිබිය හැක්කේ එකයි යනුවෙන් විනිසුරු වරුන් ප්‍රකාශ කරන ලදී.)

මේ අවස්ථාවේදී පැමිණිල්ලේ සාක්ෂි අංක 63 හා සබැඳිව පිළිගැනීමේදී සඳහන් කරන ලද P.A මාලිනීව දක්වමින් පැ3,4 සහ 5 සම්බන්ධයෙන් සාක්ෂි මෙහෙයවීමට ඇයව කැඳවීමට බලාපොරොත්තු වන බව දක්වමින් රජයේ අධිනීතිඥ මහතා අධිචෝදනා පත්‍රයේ සාක්ෂි ලැයිස්තුවට එම සාක්ෂිකරුව ඇතුලත් කරන ලදී. ( Admisson එක හරහා ඇතුලේ තිබූ භාණ්ඩ පිළිනොගන්නා ලද අතර, කුමක් හෝ ගෙනිහින් ඇත යන්න පමණක් පිළිගනී.)

සාක්ෂිකරුගේ සාක්ෂි අනුව මුෆීස් සහ හමාස් ඇඳගෙන සිටි ඇඳුම් ද පරික්ෂා කර ඇත. එහිදී මුෆීස්ගේ කලිසම් සාක්කුවෙන් මුදල් පසුම්බියක් හමු වී ඇත. එම මුදල් පසුම්බියෙන් ඉංග්‍රීසියෙන් ලියන ලද ලේඛනයක් හමු වී ඇති අතර එම ලේඛනය පොලිස් පරීක්ෂක මාරසිංහ මහතා විසින් පරික්ෂා කරනවා සාක්ෂිකරු දැක ඇති බවටත්, සාක්ෂිකරුද එම ලේඛනය දැක ඇති බවටත් පවසන ලදී. කෙසේ නමුත් ඉංග්‍රීසියෙන් ලියා තිබූයේ මොනවද යන්න මතක නොමැති බවට සාක්ෂිකරු පවසන ලදී. එම ලේඛනය සක්ෂිකරුට අධිකරණයේදී පෙන්වා සිටින ලදී. එමෙන්ම පැ 59 ලෙස ලකුණු කර ඇති මුදල් පසුම්බියද පෙන්වා සිටින ලදී. එම නඩු භාණ්ඩ ද්විත්වයම සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලදී.

මෙම ස්ථානයට සුදු පැහැති වෑන් රථයකින් භාණ්ඩ ගෙනා බවටත්, පුද්ගලයින් පැමිණි බවටත් අනාවරණය වූ බවට සාක්ෂි ලබා දෙන ලදී. එමෙන්ම අත්අඩංගුවට ගත් සැකකරුවන්ගෙන් ප්‍රශ්න කරමින් වෑන් රථය සොයා ගැනීමට උත්සහ කළ බවටත්, වාහනයේ ලියාපදිංචි අංකය සොයාගැනීමට නොහැකි වූ බවටත් සාක්ෂි ලබා දෙන ලදී. කෙසේ නමුත් මෙම වෑන් රථය කල්පිටියේ නිවසකට ගොස් ඇති බවටත්, එහි හිමිකරුවන් නොසිටි බැවින් කල්පිටියේ කොටුව බලන්න ගිය විට එහි නාවික නිලධාරීන් එහි අංකය ලියාගෙන ඇති බවටත් (එම කොටුව නාවික හමුදාවෙන් පාලනය වේ.)සාක්ෂි ලබා දෙන ලදී. නාවික හමුදාවේ නිලධාරීන් කොළඹින් අවසර ගෙන විස්තර දෙන්නම් යන්න පැවසූ බවටත්, පැය දෙකකට පමණ පසුව ඇතුලට යාමට දෙන ලද පොත බැලීමට පමණක් අවසර දී ඇති බවටත් සාක්ෂිකරු පවසන ලදී. එම වාහනයේ ලියාපදිංචි අයිතිකරු ගැන විමර්ශනය කර ඇති බවට සාක්ෂි ලබා දෙන ලදී. එම වාහනය නැරඹීමට සහ හඳුනාගැනීමට සාක්ෂි මෙහෙයවන ලදී. PA2855 යන වාහනය හඳුනාගන්නා ලදී. එම වාහනය පැ68 ලෙස ලකුණු කරන ලදී. එම වාහනය සාක්ෂිකරු භාරගෙන PR අංකයක් යොදා මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ බවට සාක්ෂි දෙන

ලදී. එය PR2න් 19 යටතේ CID හී උපසේවයට භාරදී ඇත. එම දේපළ කුවිතාන්සි පත්‍රය පැ68A ලෙස ලකුණු කරන ලදී.

ලැක්ටෝස්වත්තේ දී සාහිඩ් සහ සාහිද්ව සොයා නොගත් බවටත්, ඔවුන් දෙදෙනා අත්අඩංගුවට ගැනීමට දිගින් දිගටම විමශර්න කළ බවටත් සාක්ෂි ලබා දෙන ලදී.

නවුෆර් සහ සාජිද්ව දඹුල්ල පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත. 5 සහ 6 වූදිතයන්ව සාක්ෂිකරු හඳුනා ගන්නා ලදී.

අනතුරුව හරස් ප්‍රශ්න ඇසීම සිදු විය. මෙහිදී වූදියකු වෙනුවෙන් පෙනීසිටි නීතිඥ මහතකු ප්‍රශ්න කරමින් විමසන ලද්දේ, බුදු පිළිම කැඩීම සඳහා තමයි විමර්ශන කළේ, මේ සොයාගත්ත දේවල් බුදු පිළිම විනාස කිරීමට පාවිච්චි කරපුවාද යන්නයි. එහිදී සාක්ෂිකරු තමාට ඒ පිළිබඳව දැනීමක් නැති බවට පිළිතුරු දෙන ලදී.

මෙහිදී වූදියකු වෙනුවෙන් පෙනීසිටි නීතිඥ මහතකු ප්‍රශ්න කරමින් විමසන ලද්දේ, පාස්කු ප්‍රහාරයේ බෝම්බ පිපිරීමට සම්බන්ධ සහරාන්ගේ භාර්යාව අත්අඩංගුවට ගැනීම වැළක්වීම සඳහා සාක්ෂිකරු ත්‍රස්ත විමර්ශන ඒකකයට (TID) දැනුම් දුන් බව සාක්ෂිකරු දන්නේද යන්නයි. ඒ සඳහා පිළිතුරු දෙමින් සාක්ෂිකරු ප්‍රකාශ කරන ලද්දේ, ඒ පිළිබඳව සාක්ෂිකරුගෙන් විමසූ නමුත් එලෙස TID අයට දැනුම් දීමට බලයක් හෝ හැකියාවක් තමන්ට නොමැති බවයි. මේ අයුරින් හරස් ප්‍රශ්න ඒ ඒ වූදිත වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥ මහතුන් විසින් අසන ලදී.

පැමිණිලි පාර්ශවය වෙනුවෙන් නැවත ප්‍රශ්න ඇසීමක් ද සිදු විය.

3. **Any significant observations inside court room and outside? (උසාවි කාමරය තුළ සහ පිටත සැලකිය යුතු නිරීක්ෂණ තිබේද?) -**

4. **Next date & time (ඊළඟ දිනය සහ වේලාව):** 2022 නොවැම්බර් මස 16 වන දින

5. **Media reports about the case on this date (මෙම නඩුව පිළිබඳ මාධ්‍ය වාර්තා):**

- https://m.facebook.com/story.php?story_fbid=pfbid02ukFArZ9ceogK9NNjkfzWWeQ2hx1uW1drWFq2bRPWDGrx6GkUgkAHPW6Pjztw6YaEl&id=100084454436600&mibextid=Nif5oz